**ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 118 කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 01 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික

විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.1.1 | රු.මිලියන 63 තැන්පතු මුදල අයකර ගත යුතුය. | 3.7 ඉ |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### 1.6.1.1 ආදායම් ලැබීම්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒ.සී.ඒ -1(i) ආකෘතිය අනුව 2003.07.00 ආදායම් සංකේතයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් ප්‍රකාශනයේ පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් රැස් කිරීම යටතේ 2022 වර්ෂයේ ශුද්ධ ආදායම් රැස් කිරීම රු.437,085,714 ක් ලෙස සඳහන් කර ඇතත් නිවැරදි වටිනාකම රු.219,195,182 ක් විය. | හිඟ ආදායම් ප්‍රකාශනයේ සටහන් කිරීමේදී අතපසුවීමකින් මෙම අඩුපාඩුව සිදුවී ඇත. | ආදායම් ප්‍රකාශනයට නිවැරදි වටිනාකම් ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ඒ.සී.ඒ - 1(i) ආකෘතිය අනුව 2003.07.00 ආදායම් සංකේතයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිඟ ආදායම් ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ ආදායම හඳුනාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට ලද ආදායම රු.මිලියන 961.12 ක් වූ අතර ඉන් එකතුව රු.මිලියන 60.4 ක් 2018/19 මහ කන්නය, 2020/21 මහ කන්නය හා 2021 යල කන්නය සඳහාද වූ අතර ඉතිරි රු.මිලියන 900.7 ක් 2022/23 මහ කන්නයේ වී තොග බැහැර කිරීමේදි ලද ආදායම විය. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ DFD/MD/GPPP/Maha -2022/23 අංක දරණ 2023.07.17 දිනැති ලිපියේ අංක 2.4 පරිදි අඩු ආදායම් ලාභි පවුල් වලට සහල් බෙදා දී ඉතිරි සහල් විවෘත තරඟකාරි ලංසු කැඳවීම යටතේ විකුණා ආදායම 2003.07.00 රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන් ආදායම් ශීර්ෂයට බැර කිරීමට උපදෙස් ලබා දී ඇත. එබැවින්, සත්‍ය ආදායම හා ඇස්තමේන්තුගත ආදායම අතර ඉහළ අගයක් වාර්තා වී ඇත. | හිඟ ආදායම් හඳුනා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.350,000,000 ක් වූ අතර සත්‍ය ආදායම රු.961,121,370 ක් වූයෙන් වෙනස රු.611,121,370 ක් එනම් සියයට 175 ක අගයක් විය. දළ ආදායම් ඇස්තමේන්තුවක් සකස් කර එය සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ මුළු හිඟ ආදායම වූ රු.437,085,714 කින් සමාලෝචිත වර්ෂයේදී රු.60,407,579 ක් අයවී තව දුරටත් හිඟ ආදායම රු.376,678,135 ක් වූ අතර එය සමස්ත හිඟ ආදායමෙන් සියයට 86 ක් වැනි ඉහල ප්‍රතිශතයක් ගෙන තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ආදායම් රැස් කිරීම පිළිබඳව අමාත්‍යාංශ අධීක්ෂණයේ දුර්වලතාවය හිඟ ආදායම් රැස් කිරීමේ අකාර්යක්ෂමතාවයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | හිඟ ආදායම් රැස් කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන ලංකා සතොස මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ආදායම රු.376,678,135 ක් වුවත් විගණනය මඟින් තහවුරු කරගත් තොරතුරු අනුව එම ආයතනයෙන් අයවිය යුතු හිඟ මුදල රු.35,048,576 ක් බව නිරීක්ෂණය විය. | ලංකා සතොස මගින් අයවිය යුතු හිඟ මුදල් පිළිබඳව වැඩිදුර පරීක්ෂා කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් නොපමාව අයකර ගත යුතුය. |

**1.6.1.2 ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය ආර්ථික අංශයට අයත් රු.43,000,000 ක් වටිනා අංක CAV-5064 දරන රේන්ජ් රෝවර් ජීප් රථය අලුත්වැඩියාව නිමකර ධාවන පරීක්ෂාවක් සිදුකර නියමිත | අංක CAV-5064 දරණ ජීප් රථය අළුත්වැඩියාවට අදාළ 2023.12.29 දිනැති Tax ඉන්වොයිස් පත සඳහා රු.9,041,001 ක චෙක්පත ලියා මුදල් පොතේ ගෙවීමක් ලෙස සටහන් කරන ලදි. එසේ වුවත්, එම වාහනය | අලුත්වැඩියාව නිවැරදිව සිදු කර ඇති බවට තහවුරු කිරීමෙන් පසු ගෙවීම් වවුචරයක් පිළියෙල කර **ITMIS** |

| | | |
|---|---|---|
| පරිදි අලුත්වැඩියාව සිදුවී ඇති බවට තහවුරු කර නොගෙන ගෙවීම් වවුචරයක් පිළියෙල කර **ITMIS** පරිගණක පද්ධතියට ඇතුළත් කර රු.9,041,001 ක් වටිනා චෙක්පතක් ලියා චෙක්පත එම ආයතනයට භාර නොදී මාස 06 ක් රඳවා තබාගෙන 2024 ජූලි මාසයේදී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | ධාවන පරීක්ෂාවේදී යම් යම් දෝෂ සහිත තත්ත්වයන් පෙන්නුම් කල බැවින්, අදාළ ආයතනය දැණුවත් කර ඇත. වාහනය සම්පූර්ණයෙන්ම අළුත්වැඩියාව නිම කරන තෙක් චෙක්පත අදාළ ආයතනය වෙත නිදහස් නොකර තබාගෙන ඇති බව දන්වා සිටිමි. | පරිගණක පද්ධතියට ඇතුළත් කළ යුතුය. |

**1.6.1.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු වර්ෂ 3-5 ත් අතර කාල පරාසයකට අයත් රු.71,615 ක ණය ශේෂයක් ද, වැඩ තහනම් කළ නිලධාරියකුගෙන් අයවිය යුතු වර්ෂ 1-3 ත් අතර කාල පරාසයකට අයත් රු.175,714 ක ණය ශේෂයක් ද සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 1-5 අතර කාල පරාසයකට අයත් රු.410,933 ක ණය ශේෂයක් ද, වර්ෂ 5-20 ත් අතර කාල පරාසයකට අයත් රු.99,449 ණය ශේෂයක් ද, වර්ෂ 20ට වඩා වැඩි රු.41,108 ක ණය ශේෂයක්ද නිරවුල් නොවී පැවතුණි. | විශ්‍රාම ගිය එම නිලධාරියාගේ අපදා ණය ශේෂය සම්බන්ධයෙන් මේ වන විට නව අමාත්‍ය මණ්ඩල තීරණයේ කටයුතු සිදු කරමින් පවතින අතර එය අනුමත වූ පසු මෙම නිලධාරියාගේ ද රජයට ඇති අයවීම් නිලධාරියාගේ විශ්‍රාම වැටුප් පාරිතෝශිකයෙන් අයකර ගත හැකි බව කාරුණිකව දන්වා සිටිමි.<br>එවකට පැවති තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ සේවය කල කාර්යාල කාර්යය සහයකගෙන් 2019.10.25 වන විට අයවීමට තිබූ රු.175,714 ක මුදල සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2022.06.21 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.<br>සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.264,847ක ශේෂයන් පශු සම්පත් අංශයට අදාළ වේ. ඒ අතරින් වසර 1-3 ත් අතර රු.165,398ක ණය ශේෂයක් ද, වර්ෂ 5-10 ත් අතර රු.62,519 ක්ද,වර්ෂ 10-20 ත් අතර රු.36,930ක ණය ශේෂයක්ද පවතියි. සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.570,705 ක ණය ශේෂය තුළ ග්‍රාමීය ආර්ථික අංශයේ සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂ ඇතුළත් වේ. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.1.4 දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලියාපදිංචි අංක CBF-1592 දරන වාහනය KOPIA ව්‍යාපෘතිය යටතේ පරිත්‍යාගයක් ලෙස ලැබී මෙරටට ගෙන්වීමේදී රේගු බදු ලෙස රු.17,616,970 ක් අමාත්‍යාංශය විසින් ගෙවීම් කර තිබුණි.2018 නොවැම්බර් 16 දිනැති අංක HBM1/73301 රේගු සටහන්කරයේ අදාළ වාහනය ශ්‍රී ලංකා වරාය තෙක් මිල (CIF) වටිනාකම රු.4,643,904 ක් ලෙස සඳහන් වී තිබුණද වාහනයේ වටිනාකම ලෙස ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවූ මුදල පමණක් CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම වාහනය මේ වන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භාවිතා වන බව හඳුනා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් වන සියලුම විස්තර එම දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතය. | වාහනයේ සම්පූර්ණ වටිනාකම CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය භාවිතයේ නොපවතින නමුත් CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් වටිනාකම රු.220,729,100 ක් වන වාහන 40 ක් සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි. | වාහන 40 හි තොරතුරු CIGAS පරිගණක පද්ධතියට ඇතුළත් කර ඇත්තේ 2019 වර්ෂයේදීය. එම වාහන වල අයිතිය සංශෝධනය එම පරිගණක පද්ධතියෙහි යාවත්කාලීන වී නොමැති බැවින් යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. | නිවැරදි හා යාවත්කාලීන වූ වත්කම් පරිගණක පද්ධතියට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පටහැනි ලෙස CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් නොවන වටිනාකම රු.148,074,850 ක් වන වාහන 13 ක් හා වටිනාකම සඳහන් නොවූ වාහන 12 ක් ද වශයෙන් වාහන 25 ක් අමාත්‍යාංශයේ භාවිතයේ පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | වාහන 14 ක් අමාත්‍යාශය නමින් ලියාපදිංචි අයිතිය නොමැති බැවින් CIGAS පරිගණක පද්ධතියෙන් ඉවත් කිරීමටත් ඉතිරි වාහන එලෙසම ඇතුළත්ව තබා ගන්නා ලෙස සහ ලියාපදිංචි අයිතිය නොමැති වාහන අමාත්‍යාංශය නමට පවරා ගැනිමට ද කටයුතු කරමින් පවති. | අයිතිය නිරවුල් හා නිවැරදි වත්කම් වටිනාකම් පරිගණක පද්ධතියට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ භාවිතයේ පවතින වාහන 33 ක වටිනාකම ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණු වටිනාකම හා CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් වාහන වටිනාකම්වල රු.32,625,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී වාහන වල තක්සේරු වටිනාකම CIGAS පරිගණක පද්ධතියට ඇතුලත්කර එය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරනු ඇත. | පරිගණක පද්ධතියට නිවැරදි වාහන වටිනාකම ඇතුළත් කල යුතුය. |
| (ඉ) | එවකට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාට වෙන්කල රු.18,000,000 ක් වූ KW-8202 අංක දරන වාහනය 2021 මාර්තු 21 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් 2022 ජූලි 22 දින පැවත්වූ මු.රෙ. 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව පරික්ෂාවේදි ස්ථානීය කරුණු සම්බන්ධ නිරීක්ෂණයන් නොවීය.විධිමත් අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් කටුබැද්ද ගර්හිත වාහන අංගනයේ ගාල් කර තිබිම හා ගර්හිත වාහනයක් ලෙස නම් කිරීමට ටොයෝටා ආයතනය කටයුතු කර තිබුණු බව එම වාර්තාවේ සදහන් වූවද නිසි ක්‍රමවේදයෙන් බැහැර කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.එම වාහනයට රු.7,500,000 ක වන්දියක් ගෙවීමේ එකඟතාවය මත 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාපටිපාටි අනුගමනය නොකර පෞද්ගලික ආයතනයකට අලුත්වැඩියාවට සඳහා 2022 දෙසැම්බර් 12 දින භාරදී 2023 මාර්තු 23 දින රක්ෂණ ආයතනය එම ගරාජය වෙත රු.5,625,000 ක් ගෙවීම කර තිබුණි.අමාත්‍යාංශය විසින් ගරාජය සමග ගිවිසුම්ගත වීම, කාර්යසාධන බැඳුම්කරයක් හෝ ලබා නොගෙන අලුත්වැඩියාවට වැයවන සම්පූර්ණ මුදලම සැපයුම්කරුට ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. විගණනය | අනතුරු සිදු වූ වේලාවන් සමඟ සැසදිමේ දී රථයේ ගමන්ගත්තවුන්ගේ ජීවිත අවධානම සහ එමගින් ගැලවීමට උත්සහ ගැනීමක් විනා සඳහන් කර ඇති සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් අනාවරණයක් ප්‍රායෝගිකව අපහසු බව නිරීක්ෂණය වේ.අනතුර සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත විධිමත් දැනුම්දීමක් සිදු කර ඇත්තේ අනතුර සිදු වූ දිනට පසු දින වන අතර ඒ වන විටත් රථය බාරව කටයුතු කළ අය විසින් (ආ) ඡේදයේ සඳහන්ව ඇති පරිදි කටයුතු කර ඇති බව නිරීක්ෂණය කරමි. ටොයෝටා ලංකා ආයතනය 2021.03.25 දින මෙම රථය ගර්හිත රථයක් ලෙස සලකා කටයුතු කරන බවට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර තිබුණි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් මොරටුවේ පිහිටි අබලි වාහන අංගනය වෙත රථය යොමු කිරීම සම්බන්ධයෙන් කිසිදු විධිමත් දැනුම් දීමක් හෝ විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොමැත.යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය පරිදි අමාත්‍යාංශයේ ලියාපදිංචි ගරාජයක් වෙත රථය යොමු කර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව දැනුවත් කර ඇත. අදාල අත්තිකාරම් මුදල ගෙවා ඇත්තේ ද රක්ෂණ සමාගම විසිනි. අලුත්වැඩියාව සඳහා ගිවිසුම ප්‍රකාරව සම්පූර්ණ මුදලම රක්ෂණ සංස්ථාව විසින් ගෙවනු ලබන බැවින් සහ මූල්‍යමය වශයෙන් කිසිඳු මැදිහත්වීමක් අමාත්‍යාංශය පාර්ශවයෙන් නොදරන බැවින් කාර්යය සාධන බැඳුම්කරයක අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය කරමි.<br>අදාල අලුත්වැඩියා ආයතනයේ කළමණාකාරිත්වය සමඟ කරන ලද දුරකථන සාකච්ඡාවට අනුව දින 90 ක් ඇතුලත රථයේ අලුත්වැඩියා කරන ලෙස ලිපියක් මඟින් ද අදාල ආයතනය දැනුවත් කර ඇත. | මු.රෙ. 104(4) යටතේ අලාභයන් සලකා තක්සේරු කිරීමේදී අවස්ථානුකූලව සියලුම කරුණු මෙන්ම අලුත්වැඩියාව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාපටි පාටි අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විසින් 2023 දෙසැම්බර් 21 දින එම අනතුරට පත් වාහනය භෞතිකව නිරීක්ෂණය කළ අතර මෙම වාර්තාවේ දින වනවිටත් අලුත්වැඩියාව නිමකර නොතිබුණි. | | |
| (ඊ) | 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව කෘෂිකර්ම, පොහොර සහ පශු සම්පත් අංශයන්හි භාණ්ඩ වර්ග 57 ක අයිතම 88 ක අතිරික්තයක්ද භාණ්ඩ වර්ග 115 ක අයිතම 249 ක ඌනතාවයක් නිරීක්ෂණය වුවද මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව ඇතැම් අයිතමයන්හි ඌනතා හා අතිරික්තයන්ට හේතුවී ඇත්තේ එක් එක් අංශ අභ්‍යන්තර වශයෙන් භාණ්ඩ හුවමාරු කර ඇති බැවින් එක් අංශයේ ඌනතාවයක් දක්නට ලැබෙන විට අනෙත් අංශයේ අතිරික්තයක් දක්නට ලැබේ.මේ පිළිබඳ සලකා බලා ඒ ඒ අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛණ නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | 2021 ජූනි 21 දින ග්‍රාමීය ආර්ථික අංශයේ CAV-5064 දරන රේන්ජ් රෝවර් ජීප් රථය පණගැන්වීමට නොහැකි තත්ත්වයකට පත්වීමට බලපෑ නිශ්චිත කරුණු හා ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන නොතිබුණි. මෙම වාහනය අලුත්වැඩියාව සඳහා අවස්ථා 5කදී ඇස්තමේන්තු ලබා ගෙන තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ දී රු.3,076,878 කට සිදුකර ගැනීමට හැකියාව තිබුණු අලුත් වැඩියා කටයුත්ත වසර 03 ක් ගත වී සමාලෝචිත වර්ෂයේ දී රු.9,041,001 කට ඉටු කරවා ගැනීමට තීරණය කර අලුත් වැඩියාව සඳහා දේශීය නියෝජිතයා වෙත භාර දී තිබුණි. නමුත් මෙම වාර්තාවේ දිනය වන විටත් අදාළ අලුත් වැඩියාව සිදු කර නොතිබුණි. | 2023.04.19 දිනැතිව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කර 2023.06.01 දිනැති එකී වාර්තාව අනුව රථයේ සිදු වූ දෝෂය indicate කිරීමට ඇති සංඥා නිසියාකාරව ක්‍රියා නොකිරීමට රථයේ යම් දෝෂයක් බලපා ඇති බව නිරීක්ෂණය කර ඒ සඳහා වගකිව යුතු නිශ්චිත පුද්ගලයෙක් හෝ පාර්ශවයක් පැහැදිලිව හඳුනාගත නොහැකි බව නිර්දේශ කර ඇත. ඉහත අළුත්වැඩියාව සඳහා 2021.07.28 දිනැතිව ඇස්තමේන්තු අංක QK 4164 දරණ රු.3,076,878 ක පළමු ඇස්තමේන්තුව සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන අමාත්‍යාංශ වැය ශීර්ෂය තුළ නොතිබීම හේතුවෙන් 2021 වර්ෂයේදී මෙම වාහනයේ අළුත්වැඩියාව සිදු කර නොමැත. නව ඇස්තමේන්තුවක් ලබාගන්නා ලෙස අමාත්‍යාංශ යාන්ත්‍රික ඉංජිනේරු ලබා දුන් උපදෙස් මත 2023.11.25 දිනැතිව ඇස්තමේන්තු අංක QK 4164 දරණ රු.9,041,001 ක නව සංශෝධන ඇස්තමේන්තුව ඇක්සස් මෝටර්ස් (පුද්ගලික) සමාගම විසින් යොමු කර ඇත. ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන ද ලබා දී ඇත. | ධාවනය කිරීමට නොහැකි නිශ්චිත හේතු හා ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමටත් කඩිනමින් අලුත් වැඩියාවන් සිදු කිරීමටත් පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ විසින් 2023 දෙසැම්බර් 31 දිනට රු.1,568,540 ක් වූ බැදීම් හා බැරකම් අදාළ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණු අතර පශු සම්පත් අංශයට අයත් රු.858,302 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇමුණුම් අංක iii යටතේ ඇතුළත් කර නොතිබුණි. | අදාළ වවුචර්පත් 2024 ජනවාරි මසට පසුව ලැබුණු බැවින් ගිණුම් සඳහා ඇතුළත් කිරීමට නොහැකි වී ඇත ඉදිරියේදී බැදීම් හා බැරකම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. 2023 දෙසැම්බර් මස වියදම් වවුචර්පත් 2024 ජනවාරි මසට ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ නිසා අදාළ බැදීම් හා බැරකම් ප්‍රකාශ ඇමුණුම් අංක iii යටතේ ඇතුලත් කිරීමට නොහැකි විය. | සියලුම බැදීම් හා බැරකම් අදාළ ලේඛනයේ ඇතුළත් කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මු.රෙ.138 | 335,740 | ගෙවීම් සඳහා වෙනත් වවුචරයක් පසු අවස්ථාවක සහතික කිරීම වළක්වාලීම සඳහා බලයලත් නිලධාරියෙකු කටයුතු කළ යුතු වුවද එම විධිවිධාන නොසලකා ග්‍රාමීය ආර්ථික අංශය විසින් නාම මාත්‍ර ඉන්වොයිස් පත්‍ර 03 ක්, | නාම මාත්‍ර ඉන්වොයිස් 03 න් ඉන්වොයිස් පත්‍ර 02 ක් යුනයිටඩ් මෝටර්ස් ලංකා පුද්ගලික සමාගම අනුරාධපුර ශාඛාවෙන් නිකුත්කරන ලද රු.55,658 හා රු.113,832 ක ඉන්වොයිස් පත්‍ර වේ.අනෙකුත් නාම මාත්‍ර ඉන්වොයිස් පත්‍රය ඔෆිස් නෙට්වර්ක් පුද්ගලික සමාගමට අදාළ වන අතර ඊට අදාළ Tax Invoice පත්‍රය | වවුචරයන් සඳහා ගෙවීම් කිරීමේදි සත්‍ය හෝ සහතික කරන ලද බිල්පත් හෝ ඉන්වොයිස් මුල් පිටපත් අමුණා තිබිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ඡායා පිටපත් 03 ක් සහ මිල කැඳවීම් පදනම් කරගෙන ගෙවීම් වවුචර් 07 කට ගෙවීම් කර තිබුණි. | අදාළ ගෙවීම් සිදුකරන අවස්ථාවේ නිකුත් කර තිබුනි.අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන Dongle වෙනුවෙන් ඩයලොග් සමාගම බිල්පත්වල මුල්පිටපත ඉදිරිපත් නොකරණ අතර,එම බිල්පත් email මඟින් අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව එහි පිටපතක් ලබාගෙන ගෙවීම් කිරීම සමාන්‍ය ක්‍රියාවලිය වේ. | |
| (ආ) | 2021 අප්‍රේල් 21 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක 38 | 596,000 | රු.500,000 ට වැඩි අලුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද 2023 වර්ෂය තුළ අංක KY – 5535 දරන රථය සඳහා අලුත්වැඩියාවක් සිදුකර තිබුණද උක්ත අනුමැතිය ලබාගෙන නොතිබුණි**.** | KY 5535 රථය 2023.12.22 දින යොමු කළ රු.596,000 ක වටිනාකමකින් යුතු වූ අළුත්වැඩියාව අමාත්‍යාංශයේ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2023.11.08 දින යොමු කර ඇති අතර**,** 2023.12.21 දිනැතිව එකී කමිටුව විසින් අළුත්වැඩියාව සඳහා අනුමැතිය ලබා දී ඇත**.** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව නිසි අනුමැතිය ලබාගත යුතුය**.** |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම් 02 ක අවස්ථා 05 කදී තැන්පත්කල වර්ෂ 02 ඉක්ම වූ රු.740,439 ක පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.2,232 ක් රජයේ ආදායමට ගෙන රු.245,532 ක මුදල වැන්දඹු හා අනත්දරු අරමුදලට ගෙන ඇත. ලෝරන්ස් ලික්විඩ්, සීමා සහිත බයෝ ෆුඩ්ස් සමගම හා කැන්ගරා හෝල්ඩින්ග්ස් ආයතනයන් හි රු.100,000 ලංසු රක්ෂණ මුදල් නිදහස් කිරීමට එම ආයතන මගින් ලබා දිය යුතු ලිපිය හා ලදුපත් ඉදිරිපත් කර නොතිබුණු අතර ලිපි මගින් එම ආයතන දැනුවත් කර ඇත. වාරියපොළ ප්‍රාදේශීය සභාව තැන්පතුව පිළිබද අදාළ ලේඛන මේ දක්වා නොලැබුණ බැවින් 2024 වර්ෂයේ දී මෙම තැන්පතු ශේෂය රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කරන ලදී. | තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී අහෝසි කරන ලද රාජ්‍ය අමාත්‍යාංශ 03 හි අංක 7040749, 7040184 හා 7040733 යන බැංකු ගිණුම් 03හි 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශෙෂයන් පිළිවෙලින් රු.223,538,157ක් හා රු.17,333,992 ක් හා රු.49,801,314 ක් වූ අතර මෙම වාර්තාවේ දිනය වන විටත් එම බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කර නොතිබුණි. තවද එම බැංකු ගිණුම් අහෝසි වී ගිය රාජ්‍ය අමාත්‍යාංශ දෙකක ලේකම් නමින් තවදුරටත් පවත්වාගෙන යාම පිළිබඳ පෙර වර්ෂයේදී විගණනයෙන් පෙන්වා දී තිබියදීත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශ වල දැනට කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ යටතේ අංශ වශයෙන් පවත්නා බැවින්, ඒ අනුව බැංකු ගිණුම් නාම වෙනස් කිරීමට කටයුතු කරමින් පවතී. | ක්‍රියාකාරිත්වයේ නොමැති බැංකු ගිණුම් වසා දැමිය යුතු අතර අමාත්‍යාංශයේ වර්තමාන ලේකම් නමින් බැංකු ගිණුම් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ලේකම්,කෘෂිකර්ම,ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් අමාත්‍යාංශ නමින් ලංකා බැංකුවේ පවතින අංක 7040507 දරන අක්‍රීය බැංකු ගිණුම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට හෝ වාර්තාවේ දිනය වන විටත් වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ වරින් වර වෙනස් වීම නිසා අක්‍රීයව පවතින මෙම ගිණුම පරික්ෂා කර වසා දැමීමට කටයුතු කරමි. | අක්‍රීය බැංකු ගිණුම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂයන් වලදී වැඩ ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.මිලියන 279.8ක්, රු.මිලියන 304ක් හා රු.මිලියන 191ක් වැයකර මඩකලපුව, වවුනියාව හා යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් අවසන් කර තිබුණද මෙම | මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීමට සිදු කළ යුතු අත්‍යවශ්‍යම සංවර්ධන වැඩකටයුතු සඳහා 2023 වර්ෂයේදි රු.4,820,350 ක් වියදම් කර 2023.12.31 වන විට එම වැඩ නිම කර ඇත.<br>වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීමට සිදු කළ යුතු අත්‍යවශය සංවර්ධන වැඩකටයුතු සඳහා 2023 වර්ෂයේ අයවැය | ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාවේ දින වන විටත් එම ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට කටයුතුකර නොතිබුණි. 2023 වර්ෂයේ උක්ත ආර්ථික මධ්‍යස්ථාන වෙනුවෙන් විදුලි ගාස්තු රු.මිලියන 1.32ක්ද, ආරක්ෂක සේවා ගාස්තු රු.මිලියන 9.21ක්ද ලෙස එකතුව රු.මිලියන 10.53ක් එම ආර්ථික මධ්‍යස්ථාන විවෘත නොකිරීම හේතුවෙන් රජයට වැය බරක් ඇති වී තිබුණි. | ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන රු.4,002,604 ක් වියදම් කර 2023.12.31 වන විට එම වැඩ නිම කර ඇත.<br>යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීමට සිදු කළ යුතු අත්‍යාවශය සංවර්ධන වැඩකටයුතු සඳහා 2023 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන රු. 6,984,365 ක් වියදම් කර 2023.12.31 වන විට එම වැඩ නිම කර ඇත.<br>2021 සිට 2023 වර්ෂය දක්වා විදුලි බිල්පත්, ජල බිල්පත් හා ආරක්ෂක සේවා ගාස්තු ගෙවීම සිදුකර ඇති අතර ඉහත මඩකලපුව, වවුනියාව සහ යාපනය යන ආර්ථික මධ්‍යස්ථාන වල දක්වා ඇති අවශ්‍යතා කඩිනමින් සම්පූර්ණ කර ගැනීමෙන් පසු 2024 වර්ෂයේ දී විවෘත කිරීමට නියමිත ය. | |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්මාන්තය තුළ තරුණයන් රඳවා ගැනීමේ වැඩසටහන (තරුණ ගම්මාන වැඩසටහන) යටතේ හම්බන්තොට,ගාල්ල,වවුනියාව හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල තෝරාගත් ගම්මාන පදනම් කරගනිමින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 120 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දී තිබුණි. සමස්ථයක් වශයෙන් සියයට 84.7 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන තිබුණද කුරුණෑගල දිස්ත්‍රික්කයේ තරුණ ගම්මාන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 6 ක් වූ අවම මට්ටමක පැවති අතර එම ගොවීන් සඳහා දෙමුහුන් මිරිස් බීජ කි.ග්‍රෑම් 1 ක් පමණක් ලබා දී ඇති බවත් නිරීක්ෂණය විය. | කාළගුණික තත්ත්වය අයහපත් වීම අතිරේක ආහාර බෝග වගාව ආරම්භ කිරීමට සුදුසු නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම. දෙසැම්බර් මස තුල වගා කටයුතු ආරම්භ කරන්නේ නම්, මිරිස් වගාව පමණක් ආරම්භ කිරීම සුදුසු බවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති බව ප්‍රාදේශීය ලේකම්, අඹන්පොල විසින් වාර්තා කර ඇත. පවතින තත්ත්වය මත මිරිස් වගාව පමණක් ආරම්භ කිරීම සුදුසු බව තීරණය කළ බැවින් අදාළ බීජ නිකුත් කරන ලෙස කුරුණෑගල දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිකවැරටිය බීජ කාර්යාලය වෙත දැනුවත් කර ඇති අතර, ඒ වන විට අදාළ ආයතනය සතුව, MICHHY1 මිරිස් බීජ, කි.ග්‍රෑම් 1ක ප්‍රමාණයක් පමණක් ඉතිරිව තිබූ බැවින් එම ප්‍රමාණය පමණක් මිල දී ගැනීමට සිදුවිය. | අපේක්ෂිත කාර්යය සාධන මට්ටම ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පශු සම්පත් අංශය විසින් ක්‍රියාත්මක සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘතියට 2023 ජාතික අයවැය මගින් වෙන්කල | “සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනය”යන වැඩසටහන සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 35.3ක ප්‍රමාණයක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | -එම- |

| | |
|---|---|
| රු.මිලියන 50 ප්‍රතිපාදනයෙන් රු.මිලියන 35.3 ක ප්‍රතිපාදන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය වෙත ශුක්‍ර දායක පුං ගවයින් මිලදී ගැනීමේ ව්‍යාපෘතියට වෙන් කර තිබුණි. ප්‍රසම්පාදනයේදී සුදුසු ලංසුකරුවෙකු ඉදිරිපත් නොවීම මත එම ප්‍රතිපාදනයන්හි ඌන උපයෝජනය හේතුවෙන් සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 24.02 ක් ලෙස ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | වෙත මාරු කර අභිජනන සතුන් ආනයනය සඳහා එම දෙපාර්තමේන්තුව විසින් දෙවතාවක් ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි.පළමුවර ඉදිරිපත් වූ එකම ලංසුකරු එම සතුන් ආනයනයට හැකියාවක් නොමැති නිසාත්, අදාළ පිරිවිතර සපුරා ගැනීමට හැකියාවක් නොවීම නිසා දෙවන වර ඉදිරිපත් වූ ලංසු ද ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන කමිටුවට සිදු විය. දෙවනවර ලංසු විවෘත කිරීම 2023.09.04 දින සිදු කර, සතුන් ආනයනය සිදු කළ නොහැකි බව දැනගත් විට එම ප්‍රතිපාදන සත්ත්ව අභිජනනයට අදාළ වෙනත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව පශු සම්පත් අංශය විසින් පරීක්ෂා කර නව අභිජනන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවූ බව පශු සම්පත් සංවර්ධන අංශය දන්වා ඇත. |

### 3.3 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අලාභය අයකර ගැනීම ප්‍රමාදවීම හෝ අයකර ගැනීමට අපොහොසත් වීම මත සිද්ධීන් 47 කට අදාළව ඉදිරියට ගෙන එනු ලබන අලාභ ශේෂයන් වූ රු.30,231,762 ක් සඳහා මු.රෙ.109 අනුව කටයුතු කර නොතිබුණි. | විගණන වාර්තාවේ සඳහන් මුදල් රෙගුලාසි 109 යටතේ කටයුතු කර නොමැති වාහන 47 අතුරින් මේ වන විට වාහන අනතුරු 10 ක කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි වාහන අනතුරු සඳහා ද මු.රෙ. 109 යටතේ කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | මු.රෙ. අනුව අලාභ ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 මාර්තු 21 දින අනතුරකට පත් වී සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ධාවනයට සුදුසු තත්වයකට පත් කර නොතිබුණු KW-8202 වාහනයේ අලාභය සම්බන්ධයෙන් පාඩු හා අත් හැරීම් ලේඛනයේ හෝ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි. | KW 8202 වාහනය අලාභය පිළිබඳ හානි හා පාඩු ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොලැබුණු බැවින් ලේඛනවල සටහන් නොකළ අතර මේ වන විට ඉදිරිපත් වූ තොරතුරු අනුව ලේඛනය යාවත්කාලීන කර ඇත. | අලාභයේ වටිනාකම් පාඩු හා අත්හැරීම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශය පොහොර ලේකම් කාර්යාලයේ අධීක්ෂණ දුර්වලතා මෙන්ම සහනාධාර පොහොර ආනයනය වෙනුවෙන් දැරියයුතු මුදල් කෙටි කාලීන බැංකු ණය මගින් සැපයුම්කරුවන්ට ගෙවීම් කර එම ණය නියමිත කාලය තුළ නොපියවීම නිසා දිගුකාලීන ණය වලට පරිවර්තනය වීම හේතුවෙන් ආනයනයනික පොහොර පිරිවැයට අමතරව විශාල පිරිවැයක් ණය පොලී වශයෙන් දැරීමට සිදුව තිබුණි. 2023 වර්ෂයේ පොහොර සඳහා වන ප්‍රතිපාදන යටතේ සී/ස ලංකා පොහොර සමාගමෙ හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ලබාගත් ණය වෙනුවෙන් පිළිවෙලින් රු.9,804,086,114 ක් හා රු.6,475,566,743 ක් ලෙස එකතුව රු.16,279,652,857 ක අමතර පොලී වියදමක් දරා තිබුණි. තවද රජයේ පොහොර සමාගම් දෙක යටතේ එකතු වටිනාකම රු.3,723,072,859 ක උපචිත පොලී වටිනාකමක් දිගුකාලීන ණයට පරිවර්තනය කිරීමේදී ඒ තුළට ඇතුළත් කර තිබූ අතර ඒ හේතුවෙන් පොලිය මත පොලියක් ගෙවමින් පවතින බවද තවදුරටත් නිරීක්ෂණය විය. | අංක 20/0293/204/022 හා 2020.02.09 දිනැති "රාජ්‍ය පොහොර සමාගම් විසින් කල්පිරුණු ණයවර ලිපි සඳහා මහජන බැංකුව වෙත ගෙවිය යුතු වටිනාකම් කාලීන ණය මුදල් බවට පත් කිරීම" යන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම තීරණය ගෙන තිබූ බව දන්වමි. | සහනාධාර පොහොර ආනයනය අධීක්ෂණය සහ ඒ වෙනුවෙන් දැරියයුතු මුදල් නිසි වේලාවට මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර පියවිය යුතුය. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| | විගණන විමසුම පිළිබඳ විස්තරය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452 (1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම් වලින් පෙන්වා ඇති | 2024 මාර්තු 17 දක්වා ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් 19 න් විගණන විමසුම් 14 ක් ආර්ථික මධ්‍යස්ථානවලට අදාළව සහ ඉතිරි විමසුම් 05 ග්‍රාමීය ආර්ථික අංශයට අදාළව විය. එම විගණන විමසුම් 05 ට මේ වන විට පිළිතුරු සපයා ඇති අතර, ආර්ථික මධ්‍යස්ථානවලට ඉදිරිපත් කරන | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කල යුතු අතර එම විමසුම් වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වුවත් ග්‍රාමීය ආර්ථික අංශයට 2023 වර්ෂය වෙනුවෙන් නිකුත් කළ විගණන විමසුම් 22 කට මෙම වාර්තාවේ දින දක්වා පිළිතුරු ලබාදී නොතිබුණි. | ලද විගණන විමසුම් 14 ට අදාළව කඩිනමින් පිළිතුරු සපයන ලෙස එම විගණන විමසුමේ පිටපතක් එක් එක් ආර්ථික මධ්‍යස්ථාන වෙත යොමු කර ඇති බවත් , අදාළ පිළිතුරු ලද විගස එවා පරීක්ෂා කර බලා විධිමත් පිළිතුරක් කඩිනමින් ඉදිරිපත් කරන බවත් කාරුණිකව දන්වමි. | |

### 3.6 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය ආර්ථික අංශය විසින් කුරුඳුවත්ත,තඹුත්තේගම,නුවරඑළිය, පිළියන්දල, නාරාහේන්පිට සහ රත්මලාන යන ආර්ථික මධ්‍යස්ථාන පිහිටි භූමිය මෙම වාර්තාවේ දින වනවිටත් විෂයභාර අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි. | කුරුඳුවත්ත ආර්ථික මධ්‍යස්ථාන පිහිටි ඉඩම පවරා ගැනීම සම්බන්ධව යෝජනාව ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br>තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන ඉඩම කෘෂිකර්ම අමාත්‍යාංශ පරිහරණය සඳහා කොන්දේසි සහිතව මහවැලි අධිකාරිය 2003.08.28 දින නිදහස් කර ඇත.<br>නුවරඑළිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවා ඇති දූම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම බදු පදනම මත ලබා ගැනීම සඳහා ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කර ඉදිරිපත් කර ඇත.<br>සීමාසහිත පිළියන්දල බෝකුන්දර විවිධ සේවා සමූපකාර සමිතිය හා වෙළෙඳ අලෙවි සංවර්ධන සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය සමඟ එළඹි අවබෝධතා ගිවිසුමක් මත ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.<br>නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගනු ලැබ නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.<br>රත්මලාන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ අයිතිය පිළිබඳව කළමනාකරණ භාරයේ ලේකම් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇත. | අදාළ ඉඩම් නිසි පරිදි විෂයභාර අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ අංක 7 හා 8 දරන ගබඩා පරිශ්‍ර 02 සඳහා කිසිඳු බදු කුලියක් නොගෙවමින් රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව විසින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් ඇතත් ඒවා සම්බන්ධයෙන් සොයා බලා ඊට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත බදු පදනම මත ලබා දී ඇති අංක 08 ගබඩාව සමඟ ගිවිසුම් ගතව ඇති අතර, ගිවිසුම අනුව හිඟ කුලිය අයකර ගැනීමට සහ අංක 07 ගබඩාව සඳහා ගිවිසුමක් සකස් කර හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | නිසි පරිදි ගිවිසුම්ගතවී හිඟ කුලිය අයකර ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | රත්මලාන ආර්ථික මධ්‍යස්ථානය සතුව කඩ කාමර 16 ක් මෙම වාර්තාවේ දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | රත්මලාන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ මාළු වෙළඳ පරිශ්‍ර 16ක් අක්‍රියව පැවතීම හේතුවෙන් එය අවස්ථා කිහිපයකදීම ටෙන්ඩර් දැමීමට කටයුතු කළද කිසිදු ඉල්ලුම්කරුවෙකු ඉදිරිපත් නොවූ බැවින් අවශ්‍යතාවය මත ගබඩා පරිශ්‍රයක් ලෙස පරිවර්තනය කිරීම සුදුසු බව 2023.05.19 වන දින පැවති කළමනාකරණ භාර රැස්වීමේදී තීරණය කරන ලදි. | සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | කුරුඳුවත්ත, දඹුල්ල සහ නාරාහේන්පිට යන ආර්ථික මධ්‍යස්ථානවල 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර පරිශ්‍ර හිඟ කඩ කුලී හා දඩ කුලී රු.153,476,465 ක් හිඟව තිබුණි.හිඟහිටි දින පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් හිඟ හිටි කාලය හඳුනාගත නොහැකි වූ අතර එම ශේෂ අයකර ගැනීමට කළමනාකාරිත්වය පියවර ගෙන නොතිබුණි. | දඹුල්ල, කුරුඳුවත්ත හා නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානවල 2023.12.31 දිනට හිඟ හිටි රු.153,476,465 ක කඩ කුලියට අදාළවන හිඟ හිටි දිනයන්,හිඟ හිටි ශේෂ වල කාල විශ්ලේෂණයක් හා එම හිඟ හිටි ශේෂ අය කර ගැනීමට කළමනාකරණභාරය ගෙන තිබූ පියවර පිළිබඳ කඩිනම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස එම කළමනාකරණභාර දැනුවත් කර ඇති අතර, එම වාර්තා ලැබුණු විගස එම තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ කඩ කුලී හා දඩ කුලී අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | 2016 අප්‍රේල් 08 දින සිට 2021 අප්‍රේල් 07 දින දක්වා එනම් වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත සී/ස ඩී.පී ජයසිංහ ටුවර්ස් ඇන්ඩ් ට්‍රාන්ස්පෝර්ට් පෞද්ගලික සමාගම සමඟ ඇතිකර ගත් අංක 2178 දරන බදු ගිවිසුම ප්‍රකාරව DPJ TOWER නැමැති ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට නැවත 2020 ජනවාරි 31 දින භාරදී ඇතත් අමාත්‍යාංශය විසින් එම බදු දීමනාකරු වෙත ගෙවන ලද රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | බදු ගිවිසුම අනුව 2016.04.08 දින සිට 2021.04.07 දක්වා වසර 05ක් සඳහා ගොඩනැගිල්ල තැන්පත් මුදල් බදු ගැනුම්කරු වෙත ආපසු ගෙවිය යුතු වේ. නමුත් රු.මිලියන 63 ක තැන්පතු මුදල එකඟ වූ පරිදි නොගෙවූ අතර එම ආයතනය වෙත ලිඛිතව දැනුම් දුන් අතර ඔවුන් ද ඊට ප්‍රතිචාර දක්වා ඇත. නමුත් එකී පාර්ශවයන් ඉදිරිපත් කර ඇති කරුණු පිළිගත නොහැකි බැවින් තැන්පත් මුදල අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමට අමාත්‍යාංශයන්ට සිදුව ඇත. | තැන්පතු මුදල අයකර ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

**විගණන නිරීක්ෂණය**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ තනතුරු 170 ක්ද, පොහොර අංශයේ තනතුරු 29 ක්ද, පශු සම්පත් අංශයේ තනතුරු 36 ක්ද, ග්‍රාමීය ආර්ථික අංශයේ තනතුරු 18 ක්ද, ජාතික පොහොර ලේකම් කාර්යාලයේ තනතුරු 25 ක්ද පුරප්පාඩුව පැවති අතර ඒ සම්බන්ධයෙන් වූ විස්තර පහත පරිදි වේ.

| අංශය | ජ්‍යෙෂ්ඨ මට්ටම | තෘතියික මට්ටම | ද්විතික මට්ටම | ප්‍රාථමික මට්ටම |
|---|---|---|---|---|
| **කෘෂිකර්ම අංශය** | 7 | 1 | 146 | 16 |
| **පොහොර අංශය** | 5 | | 20 | 4 |
| **පශු සම්පත් අංශය** | 4 | 1 | 19 | 12 |
| **ග්‍රාමීය ආර්ථික අංශය** | 4 | 2 | 8 | 4 |
| **ජාතික පොහොර ලේකම් කාර්යාලය** | 18 | 1 | 6 | - |

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

කෘෂිකර්ම අංශයේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අදාළ පරිපාලන බලධාරීන් දැනුවත් කර ඇත. පොහොර අංශයේ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැන්වා ඇත. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ මෙම තනතුරු අනුමත කර ඇත්තේ නිලධාරියාට පෞද්ගලික වන ලෙසය. මේ වන විට නිලධාරින් 18 දෙනෙකු විශ්‍රාම ගොස් ඇති අතර ඒ සඳහා නව බඳවාගැනීම් සිදු කර නැත. පශු සම්පත් අංශයේ පුරප්පාඩු තවදුරටත් පවතී. ග්‍රාමීය ආර්ථික අංශයේ පුරප්පාඩු පිරවීමට ලේකම් වෙත ඉල්ලීමක් යොමු කර ඇත.

**නිර්දේශය**

වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය.